නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය - දේවහුව
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் - தேவகுவ
Resident Project Management Office - Dewahuwa

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
தேவகுவ
Ministry of Irrigation & Water Resources Management
Dewahuwa

Office- 0662287425
Fax - 0662287425
දේවහුව

මගේ අංකය
எனது இல.
My Ref No
3/3/1

ඔබේ අංකය
உமது இல.
Your Ref No

දිනය
திகதி
Date
2017.09.07

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියලුම සාමාජික මහත්ම /මහත්මින් වෙත

2017 අගෝස්තු මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

-දේවහුව ව්‍යාපාරය

දේවහුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතාගේ ප්‍රධානත්වයෙන් 2017 අගෝස්තු මස 24 දින පෙ.ව.9.30 ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ රැස්වීම් ශාලාවේදි පවත්වන ලදි. ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි රාජ්‍ය නිලධාරීන් හා ගොවි නියෝජිතවරුන් පිළිගැනීමෙන් පසු න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

සහභාගි වූ නිලධාරීන්

1. පී.ජී.රත්නසිරි මහතා	නේවාසික ව්‍යාපාර කළමනාකරු ,දේවහුව
2. ආර්.පී.වීරසූරිය මහතා	ප්‍රා.වා.ඉංජිනේරු
3. ආර්.එම්.ජී.පී.කේ.රත්නායක මෙ/ය	සංවර්ධන නිලධාරි, දේවහුව
4. ඩී.එම්.යූ.ධර්මපාලි මිය	ඉංජිනේරු සහකාර
5. ජේ.එම්.වී.ජයවර්ධන මහතා	මූලස්ථාන කෘෂිකර්ම උපදේශක.
6. බී.එම්.නදීකා කුමාරි බන්නැක මිය	කෘෂිකර්ම උපදේශක,දේවහුව
7. කේ.ජී.ආර්.කේ.චිතානගේ මිය	ජනපද නිලධාරි,දේවහුව
8. ඩබ්.ජී.කේ.අමරසිංහ මහතා	ව්‍යාපෘති සංවර්ධන නිලධාරි
9. යූ.ඩී.පී.ප්‍රිතිමාලි මිය	ග්‍රාම නිලධාරි , අංක 672
10. ඩී.ජී.ඩී.කුමාරි මිය	ග්‍රාම නිලධාරි , අංක 676 , මොරොත්තේගම
11. පී.ජී.ශ්‍යාමලී පියරත්න මිය	කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි සහකාර
12. එම්.ජී.හර්ෂණී දීපිකා වීරරත්න මෙ/ය	කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි සහකාර
13. එස්.ඒ.මානෙල් සාගරිකා මිය	කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි සහකාර
14. බී.ඒ.වී.කේ.දිල්රුක්ෂි මිය	සංවර්ධන නිලධාරි, ගොවිජන සේවා,දේවහුව
15. එච්.එම්.එම්.එස්.හේන්නායක මහතා	තාක්ෂණ සහයක (වාරිමාර්ග)
16. ඊ.එස්.වික්‍රමසිංහ මහතා	ස.අධ්‍යක්ෂ. ජලජීවී වගා ස. අධිකාරිය

සහභාගි වූ ගොවි නියෝජිතයින්

17. ඩී.එම්.එස්.දසනායක මහතා	සභාපති ,යාය1-2 ගැමුණු ගොවි සංවිධාන
18. ඒ.ජී.ගුණදාස මහතා	සභාපති.යාය 03 පෙරමුණ ගොවි සංවිධානය
19. ජේ.ජී.චන්ද්‍රසිරි	සභාපති,යාය 06 මධ්‍යම ගොවි සංවිධානය
20. ආර්.එම්.සේනාරත්න මහතා	සභාපති,යාය 08 එක්සත් ගොවි සංවිධානය
21. එම්.පී.පී.දමින්ද දිසානායක මහතා	සභාපති,යාය 05 පැරකුම ගොවි සංවිධානය
22. පී.ඒ.ජී.විජේසිංහ මහතා	ලේකම්,යාය 04 සුභද ගොවි සංවිධානය

23. ඩී.ජී.සුවර්ණලතා ගුණතිලක මිය	ලේකම්,යාය 05 පැරකුම් ගොවි සංවිධානය
24. කේ.ඒ.ජී.හේරත් බංඩා මහතා	ලේකම්,යාය යාය 01-02 ගැමුණු ගොවි සංවිධානය
25. ඒ.එම්. ජයරත්න	ලේකම්,යාය යාය 09 මානෙල් ගොවි සංවිධානය
26. එම්.ඒ.රංජිත් කරුණාතිලක මහතා	ලේකම්,යාය 03 පෙරමුණ ගොවි සංවිධානය
27. ඒ.ජී.කුමාරසිංහ ජයවීර මහතා	භාණ්ඩාගාරික යාය 01-02 ගැමුණු ගොවි සංවිධානය
28. ඒ.ඒ.සිරිසේන මහතා	භාණ්ඩාගාරික,යාය 07 මහසෙන් ගොවි සංවිධානය
29. කේ.ජී.හීංබණ්ඩා මහතා	භාණ්ඩාගාරික,යාය 05 පැරකුම් ගොවි සංවිධානය
30. සී.එස්.එෆ්.කුරුකුලසූරිය මහතා	භාණ්ඩාගාරික,යාය 06 මධ්‍යම ගොවි සංවිධානය
31. ආර්.එම්.විජේරත්න බණ්ඩා	යාය 1-2 ගැමුණු ගොවි සංවිධානය

ප්‍රථමයෙන් නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතා විසින් සර්වඥ ධාතු ප්‍රදර්ශන වැඩසටහන සඳහා සහයෝගය හා දායකත්වය ලබා දුන් රාජ්‍ය නිලධාරීන්ට හා ගොවි සංවිධාන නියෝජිතවරුන්ට ස්තුති කරන ලදී.

<u>පසුගිය වාර්තාව සමාලෝචනය හා එකඟතාවය ලබාගැනීම</u>

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවුයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට ගෙනයාමට තීරණය විය.

<u>ලිපි ඉදිරිපත් කිරීම-</u>

නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතා

1. වාරිමාර්ග කළමණාකරන අංශය මගින් සිරි දළදා යල් අස්වනු පූජාව පිළිබඳ ලිපිය.

<u>ආයතන සංවර්ධන කටයුතු</u>

නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතා

ගොවි සංවිධාන සාමාජිකත්වය ලබාදීම පිළිබඳ ගොවි සංවිධාන නියෝජිතවරුන් දැනුවත් කරන ලදී.

සංවර්ධන නිලධාරි,ආර්.එම්.ජී.පී.කේ.රත්නායක මෙ/ය

කාරණය	ප්‍රගතිය	ගොවි සංවිධානය	වෙනත්
නිලවරණය	-	-	
මහ සභා	02	එක්සත්, මානෙල්	-
කාරක සභා	06	ගැමුණු,පෙරමුණ,සුභද පැරකුම්,මධ්‍යම ,මහසෙන්	-
මුදල් සාරාංශ ලබාදීම	08	සියලුම ගොවි සංවිධාන	

<u>ඉදිරි මාසයේ පැවැත්වීමට අපේක්ෂිත නිලවරණ/මහ සභා /කාරක සභා</u>

කාරණය	ඉලක්කය	ගොවි සංවිධානය	වගකීම
නිලවරණ	03	සුභද පෙරමුණ , පැරකුම්	සංවර්ධන නිලධාරින්/ ගොවිසංවිධාන නිලධාරින්
මහ සභා	02	එක්සත් ,මානෙල්	සංවර්ධන නිලධාරින්/ ගොවිසංවිධාන නිලධාරින්
කාරක සභා	06	ගැමුණු,පෙරමුණ,සුභද පැරකුම්,මධ්‍යම ,මහසෙන්	එම

<u>වාරි මාර්ග කටයුතු -</u>
<u>ප්‍රා.වා.ඉංජිනේරු- දඹුල්ල - ආර්.පී.වීරසූරිය මයා</u>

- වැවේ ජල ධාරිතාවය අක්කර අඩි - 2970 කි.
- ඉදිරියේදී වගා කටයුතු සඳහා තව ජල මුර 02ක් ලබා දීමට නියමිතය.
- එක් ජල මුරයක් සඳහා අක්කර අඩි 500-550 ක් පමණ ජලය ප්‍රමාණයක් වැයවේ.
- වාරි පද්ධතිය කළ යුතු අලුත්වැඩියාවන් සඳහා ගොවි සංවිධාන මට්ටමින් ප්‍රමුඛතා ලැයිස්තුවක් ලබා දෙන ලෙස කමිටුව දැනුවත් කරන ලදී.
- මෙහිදී ගොවි සංවිධාන මගින් තම බල ප්‍රදේශය තුල කළයුතු වාරි පද්ධතියේ අලුත්වැඩියාවන් පිළිබඳ ප්‍රමුඛතා ලැයිස්තුවක් ගොවි සංවිධාන මගින් ඉංජිනේරු මහතා වෙත ලබා දෙන ලදී.
- ඉදිරියේ දී වාරිමාර්ග මාර්ග දෙපාර්තමේන්තු මගින් කිරීමට අපේක්ෂිත වාරි පද්ධතියේ අලුත්වැඩියාවන්

1) යාය 03 දෙගන්තුඩුව ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
2) යාය 08 Fc_1 පළවෙනි drop එක සැකසීම.
3) යාය 05 රෙගියුලේටරය අසල ගේට්ටු 02ක් දැමීම.
4) 5800 පැනි බැම්ම දැමීම.

<u>ගොවි සංවිධාන ගැටලු ඉදිරිපත් කිරීම</u>

ඉදිරිපත් කළ අය	කාරණය	තීරණය	වගකීම	තීරණය ක්‍රියාත්මක වීමට ගතවන කාලය
යාය 09 ගරු සභාපති	කුඹුරු අංක 7 සහ 8 කුඹුරු බට කැඩී තිබීම.	ඒ පිළිබඳව ලිඛිතව ලබා දිය යුතු බව	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	

නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතා

-කන්න රැස්වීමේ තීරණ කරගන්නා ලද වගාවන් සඳහා ජලය ලබාදෙන අතර එයට අමතරව ජල මුරයක් අවශ්‍ය නම් ගොවි සංවිධාන නිලධාරීන් සාකච්ඡා කර එයට හේතු දක්වමින් ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

- වැව් රක්ෂිතය හා කෙත් ඇල රක්ෂිත වෙන්කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවට දැන්වීය.
- අමතර ජල මුරයක් ලබා ගැනීම සඳහා යාය 03 සභාපති මහතා යෝජනා කළ අතර යාය 01-02 භාණ්ඩාගාරික මහතා විසින් ස්ථිර කරන ලදී.

කෘෂිකර්ම කටයුතු-මූලස්ථාන කෘෂිකර්ම උපදේශක
ජේ.එම්.වී.ජයවර්ධන මහතා

-වැඩි වශයෙන් මාස 3 ½ වී වගා කර ඇති බවයි.

-අස්වනු නෙලීමට ආසන්න දවස් 15 තුළ ජලය අවශ්‍ය නොවන බවට කෙත් ඇළ මට්ටමින් දැනුවත් කළ යුතු බවයි.

-දේවහුව ව්‍යාපාරය වගාවන් සඳහා කෘමිනාශක භාවිතය අවම මට්ටමක පවතී.

-කෘෂිකර්ම අමාත්‍යාංශය මට්ටමින් පස් සාම්පල් පරීක්ෂා කිරීමක් සිදුවේ.

-වර්ෂාව සමග ලොකු ඵැණු වගාවේ දිලීර හානිය වැඩි වී පවතී.

මුද්‍රිපත් කළ අය	කාරණය	තීරණය	වගකීම	තීරණය ක්‍රියාත්මක වීමට ගතවන කාලය
යාය 01 – 02 ගරු උප සභාපති මහතා	ඉපනැල්ලේ මුං වගා කිරීම පිළිබඳ විමසීමක් කරන ලදී.	ඉපනැල්ලේ මුං වගා කිරීමට ඉදිරියේදී කාලයක් නොමැති බව කීය.	කෘෂිකර්ම උපදේශක	

ගොවිජන සේවා දේවහුව - සංවර්ධන නිලධාරි
දිල්රුක්ෂි මිය.

-2017 යල් කන්නයේ පොහොර සහනාධාර මුදල් නොලැබුන ගොවීන් සිටී නම් එම ගොවීන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට පැමිණ දන්වන ලෙස කීය. මීට අමතරව ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ක්‍රියාත්මක වන බව කීය.

-50 kg පොහොර මිටිය රු: 2000.00 මුදලට ගොවි ජන සේවා මධ්‍යස්ථානයෙන් ලබාගත හැකි බව කීය.

ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය

-2016 / 2017 මහ කන්නයේ වගා නොකරන ලද කුඹුරු සඳහා සහනාධාර මුදල් නොලැබුණු ගොවීන් සිටීනම් එම ගොවීන් දැනුවත් කරන ලෙස කීය.

ජනපද නිලධාරි- ආර්.කේ චිතානගේ මිය

3/17 සිටි අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කුඹුරු සහ ගොඩ ඉඩම්වල මැනුම් කටයුතු කරන බැවින් රක්ෂිත වෙන් කරගැනීමට හැකි බව කීය.

ග්‍රාම නිලධාරී (676) - පලාගල ප්‍රා.ලේ.කාර්යාලය

සහනාධාර වැඩසටහන යටතේ ඊළඟ මාසය තුල කෘෂි මංමාවත් සකස්කර ගැනීමට ගොවීන්ගේ ශ්‍රම දායකත්වය ලබාදෙන බව කීය.

ජලජීවී - සහකාර අධ්‍යක්ෂ - ඊ.එස්.වික්‍රමසිංහ මහතා

දේවහුව වැව් අසල සුන්දර තොටුපලක් නිර්මාණය කිරීමේ වැඩ සටහන පිළිබඳ ගොවි සංවිධාන නිලධාරීන් දැනුවත් කිරීමක් කරන ලදී.

පි.ජී.රත්නසිරි,
නේවාසික ව්‍යාපාර කළමනාකරු,
දේවහුව.

පි.ජී.රත්නසිරි
නේවාසික ව්‍යාපාර කළමනාකරු,
වාරිමාර්ග කළමනාකරණ අංශය
නේවාසික ව්‍යාපාර
කළමනාකරණ කාර්යාලය - දේවහුව.

පිටපත් -

1. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය.කොළඹ - කා.දැ.පි
2. අධ්‍යක්ෂ,වාරිමාර්ග දෙපාර්තමේන්තුව,මහනුවර - කා.දැ.පි
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,අන්තර්පළාත්/පළාත් අනුරාධපුරය/මාතලේ - කා.දැ.පි.
4. සහකාර ගොවිජන සේවා කොමසාරිස්,අනුරාධපුරය/මාතලේ - කා.දැ.පි
5. ප්‍රාදේශිය ලේකම්,ගලේවෙල/පලාගල - කා.දැ.පි
6. වාරිමාර්ග ඉංජිනේරු,දඹුල්ල - කා.දැ.පි